අධ්‍යාපන අමාත්‍යාංශය

අ බුද්ධ ධර්මය (පෙළ.සා) .ස.පො.පෙරහුරු ප්‍රශ්න පත්‍රය 2018

පිළිතුරු පත්‍රය කොටස 1

ප්‍රශ්න අංකය	පිළිතුරු	ප්‍රශ්න අංකය	පිළිතුරු
01	4	21	2
02	1	22	1
03	1	23	2
04	2	24	4
05	1	25	2
06	4	26	1
07	3	27	4
08	3	28	2
09	2	29	2
10	3	30	4
11	4	31	1
12	1	32	3
13	1	33	1
14	4	34	4
15	1	35	1
16	3	36	3
17	1	37	2
18	3	38	3
19	1	39	4
20	4	40	2

2 කොටස

1. (I) පවින් වැළැක්වීම, යහපත් ක්‍රියාවල යෙදවීම, හොඳ හිතින් ම අනුකම්පා කිරීම, නොඇසූ දේ කියාදීම, ඇසූදේ වඩාත් පැහැදිලි කරදීම, සුගතියට මග පෙන්වීම.

(II) කාමේසු මිච්ඡා චාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
පිසුනාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
පරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
සම්පප්පලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
මිච්ඡා ආජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(III) විශේෂ පුද්ගලයකු හෝ පිරිසක් අරමුණු කොට පිහිට වීමට වැඩම කිරීම යි.

(IV) අල්පේච්ඡ වාම් ජීවිතයක් ගත කිරීම, ලද දෙයින් සතුටුවීම, පහසුවෙන් පෝෂණය හැක්කෙකු වීම, කටයුතු බහුල නොවන අයෙකු වීම.

(v) අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට, මහා කාෂ්‍යප තෙරුන්ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට,

(v I) සෝමබන්දු විද්‍යාපති, ජෝර්ජ්කීට්.

(v II) කව්සිළුමිණ, කුස ජාතකය.

(vIII) තණ්හාව, මානය, මිථ්‍යා දෘෂ්ටිය

(IX) යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති - මොක්ඛන්ති මාරබන්ධනා

(X) කුරුණෑගල නිල්ලක්කම ගම

2. (I) චාරිත්‍ර (සිරිත්, සමාදාන)

චාරිත්‍ර (විරිත්, විරමණය)

(II) මහත් වූ භෝග සම්පත් හිමිකර ගැනීම,

කීර්තිය පැතිරීම.

ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකිවීම.

සිහිමුලා නොවී කළුරිය කිරීම.

මරණින් මතු සුගතියෙහි උපත ලැබීම.

(III) 10 ශ්‍රේණිය 8 පාඩම සහ 11ශ්‍රේණිය 7 පාඩම ඇසුරු කරමින් නිති පන්සිල් රැකීමෙන් ද ආජීව අෂ්ටමක සීලය, උපෝෂත අෂ්ඨාංග සීලය, ගිහි දස සීලය සුදුසුඅවස්ථාවන්හි සමාදන්ව ආරක්ෂා කිරීමෙන් ලඟාකරගත හැකි ලෞකික ලෝකෝත්තර දියුණුව පැහැදිළි කොට ඇති ආකාරය තක්සේරුකොට ලකුණුලබා දෙන්න.

3. (I) නතං කම්මං කතං සාධූ් යං කත්වා අනුතප්පති

යස්ස අස්සු මුඛෝ රෝදං - විපාකං පටිසේවති

(II) යමක් කිරීමෙන් පසුතැවෙන්නට සිදුවේ ද, යමක විපාකය කදුළු පිරි මුහුණින් යුතු ව අඬමින් විඳින්නට සිදවේ ද එබඳු දේ නොකිරීම යහපත් ය.

(III) 11 ශ්‍රේණියේ 6 පාඩමේ බාලවග්ගයේ 8 ගාථාව හා එහි අන්තර්ගත තේරුම ඇසුරෙන් පිළිතුර සකස් විය යුතු ය. එහි දී අර්ථවත් ජීවිතයක් යනු තමාටත් අනුන්ටත් වැඩදායක වූවකි. එසේ නොවී දෙපිරිසටම අනර්ථකාරී ජීවිතයක් ගතකළහොත් එය මුළු ජීවිතකාලයටම පසුතැවිල්ලට ලක්වන්නක්වේ. එවන් අනර්ථකාරී ජීවිතගතකිරීමෙන් බැහැර ව ක්‍රියාකිරීම බුද්ධ දේශනාව බව විස්තර කරමින් පිළිතුර සකස් විය යුතු ය.

4. (I) වප්පිපුත්තක භික්ෂූන් මහන්සේලා විසින් කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක කරගෙන එනු ලැබූ දස අකැප වස්තුව.

(II) පැවැත් වූ ස්ථානය - විශාලා මහනුවර වාළුකාරාමය

මූලිකත්වය් සබ්බකාමී මහ රහතන්වහන්සේ

අනුග්‍රාහකත්වය- කාළාශෝක රජු

(III) ආවේගශීලී නොවී ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීම, බුද්ධිමත් ව නියමිත කාලයට පිළිතුරු ලබාදීම යන කරුණු සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශයට ඇහුම් කන් දී මහා කාශ්‍යප හිමි ක්‍රියාකළ ආකාරය තුළින් පිළිබිඹුවන බව.

ගැටළු විසඳීමට බුද්ධිමතුන්ගේ සහාය ලබාගැනීම.

කාරක සභාක්‍රමය ක්‍රියාත්මක කිරීම. (උබ්බාහිකාව)

නීති ගරුකව කටයුතු කිරීම යනා දී කරුණු සංගායනා තුන ඇසුරෙන් ම ගෙන පිළිතුර සකස්විය යුතු ය.

5. (I) ඊශ්වර නිර්මාණවාදය හෙවත් පුද්ගලයා සහිත ලෝකය දෙවි කෙනෙකුගේ නිර්මාණයක් ලෙස දැක්වීම.

සියල්ල පෙරකරන ලද කර්මයෙන් සිදුවන දැක්වීම. නියතිවාදය. ආත්මවාදය.

(II) චතුරාර්ය සත්‍යය නොදැනීම හේතු කරගෙන කුසල් අකුසල් රැස් කරයි.

(III) චක්කවත්ති සීහනාද සුත්‍රය මගින් දුප්පත්කම හේතු කරගෙන සමාජ ගැටළුව ඇතිවන ආකාරයත්, පාලකයා එයට නිසි විසඳුම් ලබාදීම තුළින් එම සමාජ ගැටළුව නිරාකරණය වෙන අයුරු දැක්වීම, සමාජය තුළ පවත්නා වූ ඩෙංගු මදුරු උවදුරු ඇතිවීමට හේතුත් ඒ නිසා ඇතිවන විවිධ ගැටළුත්, ඩෙංගු උවදුරු ඇතිවීමට හේතු නැති කිරීමෙන් විවිධ ගැටළු නිවාරණය වන ආකාරයත් විස්තර විය යුතු යි.

6. (I) වීරාසනය හා ධ්‍යාන මුද්‍රාව

(II) බෝධිය, වජ්‍රාසනය, පද්මය, සිරිපතුල. ධර්මචක්‍රය. හා ස්තූපය

(III) ඇතැම් පිරිස් ධන ලෝභයෙන් නිදන් වස්තු පැහැරගැනීම උදෙසා කරනු ලබන විනාසකාරී ක්‍රියා දැනගත් විගස ආරක්ෂක අංශ දැනුවත් කිරීම. පෞරාණික ස්ථාන නැරඹීමට ගිය පසු උපදෙස්වලට අනුගතව ක්‍රියා කිරීම. එම ස්ථාන දැක බලා ගැනීමට ගිය පසු පැරණි නිර්මාණ හෝ ගඩොල් බැමි මත ඇවිද නොයෑම, යනා දි වශයෙන් මෙයට අදාල පිළිතුරු (10 බුද්ධ ධර්මය පෙළපොත 20 වන පාඩමේ අවසාන ඡේදය තුළිනු ත් 11 පෙළ පොතේ 20 පාඩමේ අවසාන කොටසේ ත් ඇති කරුණු සැළකිල්ලට ගෙන) පිළිතුර සකස් විය යුතු ය.

7. (I) **පටිමාඝර** යනු පිළිම ගෙවල් ය. පිළිම නෙලීම ආරම්භක වකවානුවේ ඒ සඳහා ගෘහ විශේෂයක් නොපැවති අතර පසු කාලයේ ඒ සඳහා ගෘහයන් ඉදි විය. ඉපැරණි ප්‍රතිමාඝර වර්ග තුනකි **ගන්ධ කුටි, පාසාද හා ගෙඩිගේ** යනුවෙන් දැක්වෙනුයේ එම පිළිමගෙවල් ය. මෙම ප්‍රතිමාඝර වර්ග තුන පිළිබඳව 11 ශ්‍රේණියේ 18 පාඩමේ ඇතුලත් තොරතුරු ඇසුරෙන් පිළිතුර සකස් විය යුතු ය.

(II) අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහා නාහිමියන් පිළිබඳව 11 ශ්‍රේණියේ 5 වන පාඩමේ අන්තර්ගත කරුණු අතරින් උන්වහන්සේසේගේ ජීවන තොරතුරු, ශාසනික සේවාවන් හා ජාතික සේවාවන්, චරිතාදර්ශ පිළිබඳව කෙටියෙන් දක්වා තිබීම ප්‍රමාණවත් ය.

(III) 10 වන ශ්‍රේණියේ 13 පාඩමේ දැක්වෙන අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විස්තර කෙරෙන ත්‍රිලක්ෂණය පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් අපේක්ෂා කෙරේ. බුදුරදුන්ගේ මෙම මූලික ඉගැන්වීම පුද්ගලයාගේ මෙළොව ජීවිතය සරුකර ගැනීමට හේතුවන අයුරු සැකෙවින් විස්තර විය යුතු ය.

(IV) බුදුරජාණන් වහන්සේගේ පුරිස ධම්මසාරතී ගුණය පිළිබඳ ව 11 ශ්‍රේණියේ 2 වන පාඩම ඇසුරෙන් පිළිතුර සකස් විය යුතු ය. එහි අන්තර් කරුණු නිදසුන් සහිතත ව සැකෙවින් විස්තරකර ඇත්නම් ප්‍රමාණවත් ය.